සියලුම හිමිකම් ඇවිරිණි
முழுப் பதிப்புரிமையுடையது
All Rights Reserved

**දකුණු පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව** / தென் மாகாணக் கல்வித் திணைக்களம்

**DEPARTMENT OF EDUCATION-SOUTHERN PROVINCE**

# අවසාන වාර පරීක්ෂණය - 2021 (2022 මාර්තු)

| 9 ශ්‍රේණිය | සිංහල භාෂාව හා සාහිත්‍යය | කාලය පැය 2 |
|---|---|---|

නම / විභාග අංකය ...............................................................................................................

## I කොටස

උපදෙස් : සියලු ම ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.
I කොටසේ ප්‍රශ්නවලට මෙම පත්‍රයේ ම පිළිතුරු ලියා II කොටසේ පිළිතුරු පත්‍රය සමඟ අමුණා භාරදෙන්න.

- **ඉරි ඇඳි පදයේ අර්ථයට සමාන පිළිතුර තෝරා යටින් ඉරක් අඳින්න.**

(1) රචනයක දී වැල්වටාරම් ලිවීම දුර්වල ලක්ෂණයකි.
1. ගැටලු සහිත  2. අනවශ්‍ය විස්තර  3. සංක්ෂිප්ත තොරතුරු  4. අනවශ්‍ය උපදෙස්

(2) පාසලේ වාර්ෂික අධ්‍යාපන චාරිකාව යාමට සිසුන් එක පයින් සිටින බව විදුහල්පතිතුමා ප්‍රකාශ කළේ ය.
1. හදිසියේ ම  2. ඉක්මනින්  3. සිතැඟි පරිදි  4. දැඩි කැමැත්තෙන්

- **3-4 ප්‍රශ්නවල ඉරි ඇඳි පදයේ අර්ථයට සමාන පිළිතුර තෝරන්න.**

(3) කලාවේ අරමුණ විය යුත්තේ පුද්ගලයා තුළ ශික්ෂණය ඇති කිරීමයි.
1. හික්මීම  2. ලස්සන  3. අවධානය  4. ගැළපීම.

(4) කුමාරතුංග මුනිදාස මහතා අද්විතීය ළමා සාහිත්‍ය කලාවක් නිර්මාණය කළ ලේඛකයෙකි.
1. ස්වාධීන  2. අසහාය
3. සුපැහැදිලි වූ  4. කිසිවෙකුට දෙවෙනි නොවන

(5) උත්පත්ති ස්ථාන අනුව, 'ත, ථ, ද, ධ, න' අක්ෂර අයත් වන්නේ,
1. දන්තජ ය  2. තාලුජ ය  3. ඕෂ්ඨජ ය  4. කණ්ඨජ ය

(6) අකාරාදි පිළිවෙළට සැකසූ විට නිවැරදි පද පේළිය කුමක් ද?
1. ගොළු මුහුද, කිරි මුහුද, රතු මුහුද, නිල් මුහුද  2. කිරි මුහුද, ගොළු මුහුද, නිල් මුහුද, රතු මුහුද
3. නිල් මුහුද, රතු මුහුද, කිරි මුහුද, ගොළු මුහුද  4. කිරි මුහුද, නිල් මුහුද, රතු මුහුද, ගොළු මුහුද

(7) සෑම පදයක ම අක්ෂර වින්‍යාසය නිවැරදි ව යෙදී ඇති පද පේළිය කුමක් ද?
1. මර්ධනය, බලගතු, ප්‍රාසංගික, පලාත  2. ප්‍රශ්ණ, කැකුලු, කැළණිය, නිවර්තන
3. මර්දනය, පුස්තකාලය, රක්ෂිත, විද්‍යුත්  4. අතිකාල, කුලමල, අළුත්, කාර්යාල

(8) 'කවා පොවා' යන යුගල පදය අයත් වන යුගල පද වර්ගය වන්නේ,
1. සමාන අර්ථ ඇති යුගල පදයකි
2. පූර්ව ක්‍රියා පද දෙකක් එකතු වීමෙන් සෑදෙන යුගල පදයකි
3. පළමු පදයේ පමණක් අර්ථය ඇති යුගල පදයකි
4. ශබ්ද අනුකරණය සහිත යුගල පදයකි

(9) පද දෙක ම අනුක්ත පද ඇතුළත් වන වරණය කුමක් ද?
1. නිළියක ගුරුවරුන්  2. ළමයින්, ඔවුහු
3 ළමයි, අප  4.ඇතැමෙක්, ගෙහිමියන්

(10) 'කරවයි', 'පැමිණියහොත්' යන පද දෙක පිළිවෙළින් අයත් වන ක්‍රියා පද වර්ගය කුමක් ද?
1. විධි ක්‍රියා, කාලාර්ථයේ අසම්භාව්‍ය ක්‍රියා
2. පූර්ව ක්‍රියා, අනියමාර්ථයේ අසම්භාව්‍ය ක්‍රියා
3. මිශ්‍ර ක්‍රියා, කාලාර්ථයේ අසම්භාව්‍ය ක්‍රියා
4. ප්‍රයෝජ්‍ය ක්‍රියා, අනියමාර්ථයේ අසම්භාව්‍ය ක්‍රියා

(11) 'මා විසින් පොතක් කියවනු ලැබේ' යන කර්ම කාරක වාක්‍යය කර්තෘ කාරකයට හැර වූ විට නිවැරදි පිළිතුර වන්නේ,
1. මා විසින් පොතක් කියවන ලදී
2. මම පොතක් කියවමි
3. මම පොතක් කියෙව්වේ ය
4. මා විසින් පොතක් කියවෙයි

(12) 'විතර, තරම්, බැගින්' යන පද අයත් වන නිපාත පද වර්ගය වන්නේ,
1. සමුච්චාර්ථයේ නිපාත පද
2. සීමාර්ථයේ නිපාත පද
3. ප්‍රමාණාර්ථයේ නිපාත පද
4. කාලාර්ථයේ නිපාත පද

(13) 'පොතක ආරම්භයේ දී ම අපට දක්නට ලැබෙන්නේ,
1. උප ග්‍රන්ථය
2. පිදුම
3. පරිශිෂ්ටය
4. ප්‍රස්තාවනාව

- **14 සිට 16 දක්වා ප්‍රශ්නවල හිස්තැනට ගැළපෙන වඩාත් නිවැරදි ව්‍යාකරණානුකූල පදය තෝරන්න.**

(14) වැදිරිය මහාසාර පලඳනාව හොරකම් ....................
1. කළා ය
2. කළෝ ය
3. කළේ ය
4. කරන ලදී

(15) ලෝවැඩ සඟරාව, ලෝකෝපකාරය, සිරිත් මල්දම, සුභාෂිතය ආදී සියලු ම පොත් උපදේශ සාහිත්‍ය ග්‍රන්ථයෝ...............
1. වෙයි
2. වන්නේ ය
3. වෙති
4. විය

(16) ............................ අම්මාත් සමඟ කඩයට ගියෙමු.
1. මම
2. අපත්
3. අපි
4. මාත්

(17) 'පිනාගෙ පොඩි ළමා - මිදුලට දුව එනා
බිඳුණු හීන බලා - කද ළඟ ගොළු වුණා
මෙම පද්‍ය ඇතුළත් පද්‍ය පන්තියේ නිර්මාතෘවරයා කවරෙක් ද?
1. පරාක්‍රම කොඩිතුවක්කු
2. එස්. මහින්ද හිමි
3. මහගම සේකර
4. කුමාරතුංග මුනිදාස

(18) 'නුඹ වහන්සේ මරණ පාසයෙන් බැඳුණු සේක. මම ස්නේහ පාසයෙන් බැඳී ගියෙමි. එහෙයින් මියෙතත් එක්ව ම ය. ගැලවී යතත් නුඹ වහන්සේ හා එක්ව යෙමි' යි,
මෙම පාඨය ඇතුළත් වන්නේ,
1. තිලමුට්ඨී ජාතකයේ ය
2. නළපාන ජාතකයේ ය
3. සාම ජාතකයේ ය
4. චුල්ල හංස ජාතකයේ ය

(19) 'මල්මල් වාරම් හරි මැ උදරම් ගයවා ගයවා ගුවනේ'
ගීතයේ ඉරි ඇඳි පද අයත් වන කාව්‍යාලංකාරය කුමක් ද?
1. උපමා
2. අනුප්‍රාස
3. රූපක
4. එළිවැට

(20) පද ගැළපීම අනුව නිවැරදි අර්ථවත් වාක්‍ය තෝරන්න.
1. කැෆර්වරු උත්සුක වන්නේ පිටි කිරි භාවිතය ප්‍රිය නො කරන අතර මව් කිරි ලබා දීම වසර හතරක් යන තුරු කෙරේ.
2. වසර හතරක් යන තුරු මව් කිරි දීම කැෆර්වරු දෙන අතර, පිටි කිරි දීමට උත්සුක නොවේ.
3. වසර හතරක් යන තුරු මව් කිරි දීම කැෆර්වරු කරන අතර ප්‍රිය නො කරන්නේ නම් පිටි කිරි ලබා දීම ය.
4. කැෆර්වරු පිටි කිරි භාවිතය ප්‍රිය නො කරන අතර, දරුවකු උපන්දා පටන් වසර හතරක් ගත වන තුරු මව් කිරි පමණක් ලබා දීමට උත්සුක වෙති.

(ලකුණු 2×20= 40)

******

## II කොටස
### සියලු ම ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.

(1) 'සිංහල සාහිත්‍යධරයෝ' යන්න ප්‍රධාන තේමාව වශයෙන් ගෙන බිත්ති පුවත්පතක් සකස් කළ බව සිතන්න. ඔබ නිරත වූ කණ්ඩායම ඇසුරෙන් පහත සඳහන් ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.

1. ඔබ තෝරාගත් සාහිත්‍යධරයාගේ නම ලියන්න.
2. ඔබේ කණ්ඩායමේ හතර දෙනෙකි. ඉතිරි තිදෙනාගෙන් තවත් යාළුවෙක් තෝරාගත් සාහිත්‍යධරයෙකුගේ නම ලියන්න.
3. ඔබ තෝරාගත් සාහිත්‍යධරයා ලියූ කෘතියක් නම් කරන්න.
4. එම කෘතිය සම්බන්ධව අර්ථවත් වාක්‍ය දෙකක් ලියන්න.
5. බිත්ති පුවත්පතක් සකස් කිරීමේ දී, ඔබගේ පන්තියේ සියලු ම ළමයින්ට ප්‍රයෝජනවත් වේ. බිත්තිපුවත් පතකින් ලැබෙන ප්‍රයෝජන දෙකක් ලියන්න.

(ලකුණු 1×5 = 5)

(2) පහත සඳහන් මාතෘකාවලින් එකක් තෝරාගෙන වචන 200 කට නො අඩු රචනයක් ලියන්න.

1. නීරෝගීමත් දිවියකට වස විසෙන් තොර ආහාර
2. ජංගම දුරකථන යහපත් ව භාවිත කිරීමේ වටිනාකම
3. පොත් කියවමු - දැනුම ලබමු
4. කැලිකසළ ඵලදායීව ප්‍රයෝජනයට ගනිමු
5. මා සිත් ගත් ඓතිහාසික පුරවරය.

(ලකුණු 20)

(3) පහත සඳහන් ඡේදය වචන 25-35 අතර වන සේ සාරාංශ කරන්න. සාරාංශයේ අග වචන සංඛ්‍යාව ද සඳහන් කරන්න.

දේශාභිමානි සාහිත්‍ය නිර්මාණ වැඩි වශයෙන් ම රචනා වූයේ කොළඹ අවධියේ මුල් වකවානුවේ දී ය. යටත් විජිත පාලනයේ නොයෙකුත් මදිපුංචිකම්වලට මුහුණ දෙමින් සිටි ලක් වැසියෝ නිදහස ලබා ගැනීමේ අවශ්‍යතාවෙන් පෙළෙන්නට වූහ. ඇස්. මහින්ද හිමි, ආනන්ද රාජකරුණා, කුමාරතුංග මුනිදස, අරිසෙන් අහුබුදු, වැනි කවීන් තම නිර්මාණ මගින් ජාතිය පුබුදු කරවන්නට සිතුවේ මේ නිසා ය. නිදහසෙන් පසුව ද දේශාභිමානි සාහිත්‍ය නිර්මාණ රැසක් බිහි විය. වර්තමාන කවීන් අතින් ද රට ජාතිය ගැන ආදරයක්, ගෞරවයක් ජනිත වන ආකාරයේ නිර්මාණ බිහි වෙමින් පවතියි.

(ලකුණු 10)

(4) පහත සඳහන් ඡේදය කියවා අසා ඇති ප්‍රශ්නවලට පිළිතුරු ලියන්න.

'සැබෑ මුහුණු ද වෙස් මුහුණු ද' ග්‍රන්ථයේ එදිරිවීර සරච්චන්ද්‍රයන් නාට්‍යමය 'අවස්ථාවක්' යන්න විග්‍රහ කරන්නේ උස් කඳු මුදුනක තබා තිබෙන ගලක් මෙන් බවයි. එය කොයි මොහොතේ කොයි අතට පෙරළේ දැයි කිව නො හැකි ය. ප්‍රේක්ෂකයා තුළ නාටකීය ආතතියක් හා කුතුහලය ගොඩ නැගෙන පරිද්දෙන් නාට්‍යයේ එන සිදුවීම් පෙළ ගැස්විය යුතු ය. එය කතා වින්‍යාසය නම් වේ. කතා වින්‍යාසය මගින් චරිත අතර ගැටුම් තුළින් නාට්‍යයක් ගොඩ නැගේ. මේ අනුව නාට්‍ය රචනයේ දී වැදගත් වන ප්‍රධානතම කරුණ වන්නේ, ගැටුම් සහිත සිදුවීම් මාලාවක් අන්තර්ගත කතාවක් තෝරා ගැනීම හා එය නාට්‍ය රසය ඉස්මතු වන පරිදි වින්‍යාස ගත කිරීම වේ. නාට්‍යයක් රචනා කිරීමේ දී රංග ශෛලිය ඉතා වැදගත් වේ. නාට්‍යයක් රචනා කළ යුත්තේ කුමන හෝ රංග ශෛලියක් පදනම් කර ගෙනයි. භරතමුණිගේ නාට්‍ය ශාස්ත්‍රයෙහි ලෝක ධර්මී හා නාට්‍ය ධර්මී යනුවෙන් මූලික රංග ශෛලීය හෙවත් රංග ආකෘතීන් දෙකක් හඳුන්වා දී ඇත.

1. එදිරිවීර සරච්චන්ද්‍ර මහතා නාට්‍යමය අවස්ථාවක් විග්‍රහ කරන්නේ, කෙසේ ද?
2. 'කුතුහලය ගොඩ නැගෙන පරිද්දෙන් නාට්‍යයේ සිදුවීම් පෙළ ගැස්වීම' හඳුන්වන්නේ කුමන නමකින් ද?
3. නාට්‍ය රචනයේ දී වැදගත් වන ප්‍රධාන කරුණු දෙක කුමක් ද?
4. නාට්‍යමය අවස්ථාවක් විග්‍රහ කරන කෘතිය කුමක් ද?
5. 'භරතමුණි' ලියූ කෘතිය කුමක් ද?

(ලකුණු 2×5 = 10)

(5) පහත සඳහන් කරුණු උපයෝගී කරගෙන ව්‍යාපාරික ලිපියක් ලියන්න.

- ඔබගේ පාසලේ පුස්තකාලයට අවශ්‍ය පොත් රාක්ක හා පොත් කබඩ් මිලදී ගැනීම.
- රන්සිරිගම, 'සහන' ආයතනයේ කළමනාකාරතුමාගෙන් ඉල්ලීමක් කරන්න.
- මේ සඳහා මුදල් ලබා දීම චෙක්පත් මගිනි.
- ඔබ පාසලේ සාහිත්‍ය සංගමයේ ලේකම් යයි සිතන්න.

(ලකුණු 10)

(6) පෙළ පොත ඇසුරෙන් අසා ඇති ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.

1. දේශීය නර්තනයේ රන් සලකුණ යනුවෙන් හැඳින්වෙන්නේ කවරෙක් ද?
2. "පුත ඔබ බෝධිසත්ත්වවරයෙකි. ඔබට බුදු බව ලැබේවා! " මෙම ප්‍රකාශය කා විසින් කා හට කියන ලද ද?
3. "ගසක දෙඩම් මදෙයි කියා කෑ දූයි අපෙ අම්මා
   අහස තරුත් මදෙයි කියා විලි ලූ දූයි අම්මා
   ..........................................................................................
   සතර අපායේ නොවැටී නිවන් දකින් අම්මා"

   මෙහි තුන්වෙනි පදය ලියන්න.

4. "මහධන සිටුපුත් වස්තුව" ඇතුළත් මුල් කෘතිය කුමක් ද?
5. සිංහල භාෂා දිනය වශයෙන් ප්‍රකාශයට පත් කර ඇති දිනය කවදා ද?

(ලකුණු 1×5 = 5)

******

දකුණු පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව
අවසාන වාර පරීක්ෂණය - 2021
සිංහල භාෂාව හා සාහිත්‍ය
9 - ශ්‍රේණිය
පිළිතුරු පත්‍රය

## I කොටස

| | | | | | | |
|---|---|---|---|---|---|---|
| 1) 2 | 2) 4 | 3) 1 | 4) 4 | 5) 1 | 6) 2 | 7) 3 |
| 8) 2 | 9) 1 | 10) 4 | 11) 2 | 12) 3 | 13) 4 | 14) 1 |
| 15) 3 | 16) 3 | 17) 1 | 18) 4 | 19) 2 | 20) 4 | |

(ලකුණු 2x20 = 40)

## II කොටස

1. පිළිතුරු සඳහා ලකුණු 01 බැගිනි.
   සුදුසු පිළිතුරු සඳහා ලකුණු පිරිනමන්න. (ලකුණු 1x5 = 05)
2. රචනය (ලකුණු 20)
   1. මාතෘකාව හා සාරවත් භාවය - (ලකුණු 08)
   2. සංවිධානය, නිර්මාණාත්මක භාවය හා ස්වීයත්වය - (ලකුණු 09)
   3. ශිල්පීය දක්ෂතා, ඡේද බෙද ලිවීම, අක්ෂර වින්‍යාසය - (ලකුණු 03)

3. සාරාංශය ලකුණු - ලකුණු 10 කරුණු - ලකුණු 06 නියමිත වචන ප්‍රමාණය - ලකුණු 02
   අක්ෂර වින්‍යාසය - ලකුණු 02

4. ලකුණු 10
   1. 'උස් කඳු මුදුනක තබා තිබෙන ගලක් කොයි අතට පෙරළේද'යි කිව නොහැකි බව'
   2. කතා වින්‍යාසය
   3. අ. ගැටුම් සහිත සිදුවීම් මාලාවක් අන්තර්ගත කතාවක් තෝරා ගැනීම
      ආ. නාට්‍ය රසය ඉස්මතු වන පරිදි වින්‍යාසගත කිරීම.
   4. 'සැබෑ මුහුණු ද වෙස් මුහුණු ද'
   5. නාට්‍ය ශාස්ත්‍රය (ලකුණු 2x5 = 10)

5. ව්‍යාපාරික ලිපිය - (ලකුණු 10)
   ලිපියේ ආකෘතිය - (ලකුණු 05)
   1. ලියන්නාගේ නම, ලිපිනය, දිනය
      ලබන්නාගේ නම, තනතුර ලිපිනය
      ආමන්ත්‍රණය
      මාතෘකාව (ශීර්ෂ පාඨය)
      අවසානය 'ස්තුතියි' ලියන්නාගේ නම, තනතුර, ලිපිය } (ලකුණු 05)
      අන්තර්ගතය - (ලකුණු 05)
   2. කරුණු නියමිත ආකෘතිය, සහ අක්ෂර වින්‍යාස නිවැරදි නම්

6. 1. ආචාර්ය එස්. පණ්ඩිභාරත
   2. "ශ්‍රී පාදය වැන්ද වූ හැටි" කතාවේ අම්මා විසින් බාල පුතාට / සිටු දුව විසින් බාල සිටු කුමරාට
   3. 'මුහුදු දියත් මදෙයි සිතා රස කිරි දුන් අම්මා"
   4. සද්ධර්ම රත්නාවලිය
   5. සෑම වසරකම මාර්තු 02 ද (ලකුණු 1×5 = 05)

(මුළු ලකුණු = 100)